ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී ගෞරව (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)උපාධි වැඩසටහන

5 වන මට්ටම -2020/2021

අවසාන පරීක්ෂණය - 2021

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝ විද්‍යාව - SNU5535/ESU3235

කාලය පැය තුනයි. (03)

---

දිනය:- 2021.07.31 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ළමයින් ඔවුන්ගේ ඉගෙනුම් ශෛලියට අනුව විවිධ වන්නේ කෙසේ ද? උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

02. I. ඉගෙනුම සඳහා විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින් පෙළඹවීමට ඔබට භාවිත කළ හැකි පෙළඹවීම් උපාය මාර්ග තුනක් (03) ලැයිස්තු ගත කරන්න.

    II. විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින් පෙළඹවීමට ඔබ යොදාගත් පෙළඹවීම් උපාය මාර්ග පිටුපස ඇති න්‍යායාත්මක බලපෑම පැහැදිලි කරන්න.

03. සමහර විෂයයන් සඳහා සුවිශේෂී අකමැත්තක් දක්වන ළමයින් සිටිය හැකිය. එම අකමැත්ත කාලයත් සමග එවැනි අනෙකුත් විචල්‍ය කරා ද සංවර්ධනය වීමක් සිදු විය හැකි ය.

    I. උක්ත දක්වන තත්වය පිටුපස ඇති ඉගෙනුම් න්‍යාය කුමක් ද?

    II. එම ඉගෙනුම් න්‍යායට අදාළව ඔබ එම තත්ත්වය පැහැදිලි කරන්නේ කෙසේ ද?

04. විගොට්ස්කිගේ ප්‍රජානන සංවර්ධන න්‍යාය අනුව විභව්‍ය සංවර්ධන කලාපය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

05. සමහර විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින්ට ඉගෙනුම සඳහා අඩු පෙළඹවීමක් තිබිය හැකි ය. එම තත්ත්වයට හේතු මොනවා ද? ඔබගේ පිළිතුර මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය ඔස්සේ සනාථ කරන්න.

06. ඉගෙනුම සහ සමස්ත සංවර්ධනය කෙරෙහි චිත්තවේගවල බලපෑම උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

07. විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත සිසුන් පිළිබඳ ගුරුවරුන්ගේ අවම දැනුමෙහි සෘණාත්මක බලපෑම් විභාග කරන්න.

08. ළදරුවාගේ භාෂාව අත්පත් කර ගැනීම සඳහා පහසුකම් සලසන පාරිසරික උත්තේජන තුනක් (03) පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. අන්තර්කරණ වාතාවරණයක් තුළ සිටින ගුරුවරයෙකුගේ ප්‍රධාන භූමිකාවක් වන්නේ සිසුන්ගේ විවිධත්වයට අනුකූලව ඉගෙනුම් අත්දැකීම් තෝරා ගැනීමයි.

I. සියළුම ළමයින්ට එකම ආකාර ඉගෙනුම් අත්දැකීම් ලබා දීමේ ප්‍රතිවිපාක මොනවා ද? (ලකුණු 10)

II. ළමයින්ගේ විවිධත්වයට අනුව ඔබ විවිධ ඉගෙනුම් අත්දැකීම් තෝරා ගන්නේ කෙසේ ද? සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. I. "ඉගෙනුම යනු චර්යාවේ සාපේක්ෂ ස්ථාවර වෙනස්කමකි."

උක්ත නිර්වචනය උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

II. 'ඉගෙනුම් න්‍යායන් පිළිබඳ දැනුම ගුරුවරයෙකුට විවිධත්වයකින් යුක්ත ළමයින්ගේ ඵලදායී ඉගෙනුම පහසු කිරීම සඳහා වැදගත් වේ.'

ප්‍රධාන ඉගෙනුම් න්‍යායන් තුනක් (03) ආශ්‍රයෙන් උක්ත ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 12)

11. I. සමහර විශේෂ අවශ්‍යතා සහිත ළමයි ප්‍රජානන සංවර්ධනය ආශ්‍රිත ගැටලුවලට මුහුණ පාති.

ප්‍රජානන සංවර්ධනය තුළ පැන නැඟිය හැකි ගැටළු සඳහා හේතු සහ එම ගැටළු මගින් ඇතිවිය හැකි ප්‍රතිවිපාක මොනවා ද? (ලකුණු 08)

II. ප්‍රජානන සංවර්ධනය තුළ බුද්ධිමය දුබලතා සහිත සිසුන් මුහුණ දිය හැකි ගැටළු තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

III. ප්‍රජානන සංවර්ධනය තුළ පැන නගින සීමාවන් කළමනාකරණය කර ගනිමින් ඵලදායී ඉගෙනුමකට පහසුකම් සැලසීම සඳහා ඔබ යොදා ගන්නා උපාය මාර්ග මොනවා ද? (ලකුණු 06)

12. I. 'පෞරුෂ සංවර්ධනය' යන යෙදුමෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05 )

II. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා බලපෑ හැකි සාධක මොනවාද? (ලකුණු 05)

III. මානුෂවාදී න්‍යාය හා මනෝ විශ්ලේෂණ න්‍යායට අනුව විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ පෞරුෂ සංවර්ධනය සම්බන්ධව දෙමාපියන් හා ගුරුවරුන්ට ඔබ උපදෙස් ලබා දෙන්නේ කෙසේ ද? (ලකුණු 10)

13. I. ළමයින්ගේ විවිධ විශේෂ අවශ්‍යතා සහිත තත්ත්ව කෙරෙහි ආරයේ බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

II. 'හැකිතාක් කලින් ළමයින්ගේ පරිසරය වෙනස් කළහොත් විශේෂ අවශ්‍යතා සහිත තත්වයෙහි සෘණාත්මක බලපෑම් අවම කර ගත හැකි ය.'

ඔබ උක්ත ප්‍රකාශය හා එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

14. I. විශේෂ අවශ්‍යතා සහිත තරුණයින් මුහුණ දෙන ශාරීරික, ප්‍රජනන සමාජ, හා චිත්තවේගික ගැටලු මොනවා ද? (ලකුණු 10)

II. විශේෂ අවශ්‍යතා සහිත තරුණයින්ගේ උක්ත සඳහන් කළ ගැටළු අවම කිරීමට වැඩ සටහනක් සැකසීමට ඔබගෙන් අපේක්ෂා කළා යැයි සිතන්න.

විශේෂ අවශ්‍යතා සහිත තරුණයින් මුහුණ දෙන උක්ත ආකාර ප්‍රශ්න කළමනාකරණය/අවම කිරීමට ඔබ භාවිත කරන උපාය මාර්ග මොනවා ද? (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.